කෘෂි නවීකරණ ව්‍යාපෘතිය
விவசாய நவீனமயமாக்கல் திட்டம்
Agriculture Modernization Project

THE WORLD BANK

## කෘෂිකර්ම අමාත්‍යාංශය

# කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය

## (ලෝක බැංකුව මගින් අරමුදල් සපයන)

# ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම (මධ්‍යම පළාත)

සුළු පරිමාණ ගොවීන් හට තරගකාරී සහ අලෙවි කළ හැකි වෙළඳ භාණ්ඩ නිෂ්පාදනය කිරීමට , වෙළඳපල අවශ්‍යතා සපුරාලීම සඳහා ඔවුන්ගේ හැකියාවන් වැඩි දියුණු කිරීම සහ වාණිජකරණය කරා යොමු වීමට සහය වීමට රටවල් සමග හවුල්කාරීත්ව උපාය මාර්ගයක් (CPS) සමග අනුකූල වෙමින් කෘෂි නවීකරණ ව්‍යාපෘතිය සඳහා අරමුදල් සැපයීමට ලෝක බැංකුවේ අන්තර්ජාතික සංවර්ධන ඒජන්සිය මගින් එකග වී ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කාලය වසර 05ක් වන අතර , ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම ඇමරිකානු ඩොලර් මිලියන 58.63 වේ.

2019.03.15 දින දරන, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 ට අනුව පහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය කරන සුදුසුකම් සහ පළපුරුද්ද සහිත අපේක්ෂකයින්ගෙන් මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් විසින් මධ්‍යම පළාතේ පළාත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**මූල්‍ය නිලධාරී (PS 6 - A) - තනතුර 01**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් සුදුසුකමක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක් / ඒ හා සමාන වෘත්තීමය සුදුසුකමක් හෝ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික වෘත්තිය කොමිෂන් සභාව මගින් පිළිගත් තාක්ෂණික / වෘත්තිමය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 07 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාගැනීම.

   සහ

   විශේෂඥතාවය අවශ්‍ය කරන ක්ෂේත්‍රයේ අවම වසර 02 ක පළපුරුද්ද හෝ

2. තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික වෘත්තිය කොමිෂන් සභාව මගින් පිළිගත් තාක්ෂණික / වෘත්තිය පුහුණු ආයතනයක් මගින් නිකුත් කළ ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) 06 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   සහ

   විශේෂඥතාවය අවශ්‍ය කරන ක්ෂේත්‍රයේ අවම වසර 07 ක පළපුරුද්ද හෝ

   තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතියික වෘත්තිය කොමිෂන් සභාව මගින් පිළිගත් තාක්ෂණික / වෘත්තිය පුහුණු ආයතනයක් මගින් නිකුත් කළ ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) 05 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   සහ

   විශේෂඥතාවය අවශ්‍ය කරන ක්ෂේත්‍රයේ අවම වසර 12 ක පළපුරුද්ද

**වැටුප :** 2019.03.15 වන දින දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 මත වැටුප පදනම් වේ.

**පොදු කොන්දේසි**

a. වයස් සීමාව – අයදුම්පත්‍ර භාරගන්නා අවසන් දිනයට වයස අවුරුදු 64 ට වැඩි අපේක්ෂකයින් අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

b. රැකියා කොන්දේසි

   රාජ්‍ය සේවයට අයත් නිලධාරීන් ද්විතීයික පදනම යටතේ බඳවා ගනු ලබන අතර, රාජ්‍ය සේවයෙන් බැහැර පුද්ගලයින් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ. සෑම පත්වීමක් සහ සේවා දීර්ඝ කිරීමක්, 2019.03.15 දින දරන කළමනාකාර සේවා චක්‍රලේඛ අංක 01/2019ට අනුව සිදුකරනු ලැබේ.

c. සුදුසුකම් සහ පළපුරුද්ද මත තෝරාගනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.

**අයදුම්පත්‍ර**

සෑම අයදුම්කරුවෙක්ම තම අයදුම්පත්‍ර ජීව දත්ත සහිතව , ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙක් සහ සහතික පත්‍රවල පිටපත් සමග, ලියාපදිංචි තැපෑලෙන් **"ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය, මධ්‍යම පළාත් සභා සංකීර්ණය, පල්ලෙකැලේ, කුණ්ඩසාලේ"** යන ලිපිනයට 2020-09-30 වන දිනට හෝ ඊට ප්‍රථම යොමු කළ යුතු වේ. දැනට රාජ්‍ය / අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්‍ර ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානී හරහා යොමු කළ යුතුය.

අයදුම් කරනු ලබන තනතුර, අයදුම්පත්‍රය බහා එවන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කර එවිය යුතුය.

ඉහත බඳවා ගැනීම සම්බන්ධව ප්‍රධාන ලේකම්වරයාගේ තීරණය අවසාන තීරණය වේ.

**ගාමිණී රාජරත්න,**
**ප්‍රධාන ලේකම්,**
**මධ්‍යම පළාත.**